මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වීම අද වන විට සමාජ ගැටළුවක් බවට පත්ව ඇති බව නොකිවමනායි. එනිසාම, එම ඇබ්බැහි වූවන්ව ඉන් තිරසාරව මුදවා ගැනීමද අවශ්‍යතාවයකි. එහිදී, මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවන්ව ඉන් මුදවා ගැනීම මෙන්ම, ඔවුන්ව ධනාත්මක ලෙසින් යළිත් සමාජයට එක් කොට ගැනීම පිළිබඳවද අපගේ සැලකිල්ල යොමු විය යුතුයි.

නමුත්, සමාජය තුළත්, මාධ්‍ය තුළත් මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවන්ව සෘණාත්මකව ලේබල් ගත කිරීම් දක්නට ලැබේ. පහත පුවත් වාර්තාවන් තුළ දක්නට ලැබෙනා "කුඩ්ඩා", "කුඩු පුතා" වැනි යෙදුම් ඊට උදාහරණ වේ.

1) මෙවැනි සෘණාත්මක ලේබල්ගත කිරීම් ඔස්සේ, මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූවන්ව කොන් කිරීමේ ආකල්පයක් සමාජය තුළ මුල්බැස නොගන්නේ ද? ඔවුන් පුනරුත්ථාපනයෙන් පසු එම ඇබ්බැහියෙන් මිදුනද, ඔවුන්ට යළි සමාජයට එක් වීමට පවා එය බාධාවක් නොවන්නේ ද?

2) "කුඩ්ඩා" හෝ "කුඩු පුතා" වැනි සෘණාත්මක ලේබල් කිරීම් වෙනුවට, "මතට ඇබ්බැහි වූවන්", "මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන්" වැනි යෙදුම් වඩාත් යෝග්‍ය නොවන්නේ ද? මේ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?